7329 [redacted]

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

**නර්තනය - (දේශීය) I**
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

**52 S I**

2019.08.07/ 0830 - 1030

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**විභාග අංකය :** ..........................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 13 | |
| 03 | 14 - 23 | |
| 04 | 24 - 35 | |
| 05 | 36 - 42 | |
| 06 | 43 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** 'මංගලම්' නර්තනයට අදාළ මූලික බෙරපදය වන්නේ,
(1) ගත් දිත් තත් දොම් තකු දොම්
(2) දොං තකු දං ගජිංත
(3) දොං තකු දොං ජිං තක තරිකිට
(4) කුං දිත් තත් දොං තක තරිකිට
(5) දොංතකු දොංතකු දොංජිං ගත් තත් ජිං තරිකිට (.........)

**2.** කෝලාට්ටම්, සුලකු සහ චෙම්බු යන ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් ලෙස සැලකෙන්නේ,
(1) ලී කෙළි, කුලු සහ කළගෙඩි නැටුම් ය.
(2) ලී කෙළි, කුලු සහ සවරම් නැටුම් ය.
(3) කුලු , කළගෙඩි සහ මෝල්ගස් නැටුම් ය.
(4) කුලු , සවරම් සහ පතුරු නැටුම් ය.
(5) ගොයම් කැපීම, සවරම් සහ තාලම් නැටුම් ය. (.........)

**3.** "දොංත ගතම් දොංත ගතිගතම්...." යන පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
(1) මුදලි ය. (2) අණ බෙරකරු ය. (3) ජසයා ය.
(4) ලෙන්චිනා ය. (5) නොංචි ය. (.........)

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

4. “ඕඩි හෙලේ හෙල වටකර මුළුල්ලා - ගල්නළලත බැන්දා වැනි තොටිල්ලා”
මෙම කවිය අයත් ගායනා විශේෂය කුමක් ද?
(1) ගොයම් කවි (2) බඹර කවි (3) ධීවර කවි (4) පතල් කවි (5) රබන් කවි
(.........)

5. කරුණ, භයානක සහ බීභත්ස්‍ය යන රසයන්ගෙන් නිෂ්පන්න වන භාවයන් වන්නේ,
(1) භය, ශෝක සහ උත්සහයයි. (2) භය, ශෝක සහ විශ්මයයි.
(3) ශෝක, භය සහ ජුගුප්සාවයි. (4) ශෝක, භය සහ හාස්‍යයයි.
(5) ශෝක, භය සහ රතියයි.
(.........)

6. අනුරාධපුර කුට්ටම් පොකුණ අසලින් ලැබුණු ලෝකඩ රූපයෙන් පිළිබිඹු වන්නේ,
(1) නිළියන් සහ නළුවන්ගේ රූප පෙළකි.
(2) බෙර වාදකයකුගේ රූපයකි.
(3) භ්‍රමණය වන නළඟනකගේ නර්තන විලාසයකි.
(4) වීණා වාදකයින් සහ තාලම්පට වයන රූපයකි.
(5) නටන ස්ත්‍රියක සහ පුරුෂයකුගේ විලාසයකි.
(.........)

7. වාහල හා පත්තිනි නර්තනය දැකිය හැකි වන්නේ,
(1) පහතරට දෙවොල්මඩුවේ දී ය. (2) උඩරට ගම්මඩුවේ දී ය.
(3) සබරගමු පහන්මඩුවේ දී ය. (4) පහතරට පහන්මඩුවේ දී ය.
(5) සබරගමු දෙවොල්මඩුවේ දී ය.
(.........)

8. උඩරට, පහතරට සහ සබරගමු ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය පෙළපාළි අවස්ථා පිළිවෙළින්,
(1) ඌරා යක්කම, නානුමුරය සහ පොත්කඩේ යක්කම වේ.
(2) ඌරා යක්කම, කෝල්මුරය සහ අසුර යක්කම වේ.
(3) නයා යක්කම, පොත්කඩේ යක්කම සහ දර්ශන යක්කම වේ.
(4) ආවැන්දුම, නානුමුරය, දළුමුර පාළිය වේ.
(5) ගුරුගේමාලාව, නානුමුරය සහ දේවකෝල්පාඩුව වේ.
(.........)

9. වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් ඇතුළත් වරණය තෝරන්න.
(1) උරමාල පටිය, බුබුලු පටිය, හස්තකඩය (2) උරමාල පටිය, බුබුලු පටිය, සිලුමිණ
(3) සිබා බන්ධනය, අවුල් හැරය, සේලය (4) සිබා බන්ධනය, අවුල් හැරය, උල්උඩය
(5) අවුල් හැරය, උරමාලය, උල්උඩය
(.........)

10. පොත්කඩේ පාළිය හා වඩිග පටුන යන පෙළපාළි අංග දැකිය හැකි වන්නේ,
(1) පහන් මඩුවේ හා සූනියම් යාගයේ දී ය. (2) පහන් මඩුවේ හා රටයකුමේ දී ය.
(3) දෙවොල් මඩුවේ හා රටයකුමේ දී ය. (4) දෙවොල් මඩුවේ හා ගරායකුමේ දී ය.
(5) දෙවොල් මඩුවේ හා වලියකුමේ දී ය.
(.........)

11. අඬ ඉර, බොකු හම සහ ගැටිය යොදාගනු ලබන්නේ පිළිවෙළින්,
(1) ගැට බෙරය, පහතරට බෙරය සහ බුම්මැඩිය සඳහා ය.
(2) ගැට බෙරය, පහතරට බෙරය සහ දවුල සඳහා ය.
(3) ගැට බෙරය, රබාන සහ දවුල සඳහා ය.
(4) උඩැක්කිය, තම්මැට්ටම සහ දවුල සඳහා ය.
(5) උඩැක්කිය, රබාන සහ තම්මැට්ටම සඳහා ය.
(.........)

12. “රූ රැසේ අඳිනා ලෙසේ අත් ළෙල දීදී විදුලිය පබා .....” යන කවිය සඳහන් වන්නේ,
(1) ගම්පළ යුගයට අයත් තිසර සංදේශයේ ය.
(2) ගම්පළ යුගයට අයත් මයුර සංදේශයේ ය.
(3) කෝට්ටේ යුගයට අයත් සැළලිහිණි සංදේශයේ ය.
(4) කෝට්ටේ යුගයට අයත් ගුත්තිල කාව්‍යයේ ය.
(5) කෝට්ටේ යුගයට අයත් පරෙවි සංදේශයේ ය.
(.........)

13. පාසල් අධ්‍යාපනයේ නර්තන විෂය සම්බන්ධ ව පත් වූ ප්‍රථම අධ්‍යක්ෂවරයා වන්නේ,
(1) ඇස්. පණිභාරත ය. (2) ඩබ්ලිව්. බී. මකුලොලුව ය.
(3) එස්. එල්. බී. කපුකොටුවේ ය. (4) ජේ. ඊ. සේදරමන් ය.
(5) ශ්‍රී ජයනා රාජපක්ෂ ය.
(.........)

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

3157

**14.** 'උනුනුපියන' යනුවෙන් හඳුන්වන්නේ,
(1) කපුයක්කාරියෙහි භාවිත කපුයන්තරයයි. (2) කපුයක්කාරියෙහි භාවිත නානුමුර වට්ටියයි.
(3) සන්නියකුමේ භාවිත පිදවිලි වට්ටියයි. (4) නානුමුරයේ දී භාවිත වට්ටියෙහි පියනයි.
(5) නානුමුරයෙහි භාවිත නානුමුර වට්ටියයි. (………)

**15.** 'සිරිවසගෙන අසු නැගෙමින් නොලෙසා ....' මෙම කවියෙන් කියැවෙන්නේ කුමන ග්‍රහයා පිළිබඳ ව ද?
(1) කුජ ග්‍රහයා (2) රවි ග්‍රහයා (3) සිකුරු ග්‍රහයා
(4) බුද ග්‍රහයා (5) ශනි ග්‍රහයා (………)

**16.** කෝලම් නාටකයේ එන ජස කෝලම හා සම්බන්ධ වන අනෙකුත් චරිත වන්නේ,
(1) ලෙන්චිනා, පුරන්සිනා සහ මුදලි ය. (2) ලෙන්චිනා, නොංචි සහ මුදලි ය.
(3) ලෙන්චිනා, අණබෙර සහ චුක්කිනියා ය. (4) පුරන්සිනා, අණබෙර සහ ඩුංගුරුවා ය.
(5) අණබෙර, හෙන්චප්පු සහ හේවාරාළ ය. (………)

**17.** අත්‍යා බෙර යනු,
(1) සමූහ බෙර වාදන අවස්ථාවකි.
(2) ශිල්පීන් දෙදෙනකු අතර දක්ෂතා පෙන්වන ශාස්ත්‍රීය බෙර වාදන අවස්ථාවකි.
(3) සමූහ ශාස්ත්‍රීය මංගල බෙර වාදන අවස්ථාවකි.
(4) යුගල වශයෙන් අලංකාර බෙර පද වාදන අවස්ථාවකි.
(5) පිරිත් ආරම්භයේ දී කරනු ලබන බෙර වාදන අවස්ථාවකි. (………)

**18.** දුනුමාලප්පුව සහ කෝල්පාඩුව යනු,
(1) පහත් මඩුවේ ඒකල නර්තන වේ. (2) පහත් මඩුවේ සමූහ නර්තන වේ.
(3) දෙවොල් මඩුවේ සමූහ නර්තන වේ. (4) කොහොඹා යක් කංකාරියේ ඒකල නර්තන වේ.
(5) කොහොඹා යක් කංකාරියේ සමූහ නර්තන වේ. (………)

**19.** භරත නාට්‍යම් සංදර්ශනයක, නර්තනාංග පෙළෙහි නෘත හා නෘත්‍ය ගණයට ගැනෙන්නේ,
(1) වර්ණම් හා ශබ්දම් ය. (2) ශබ්දම් හා තිල්ලානා ය.
(3) ජතිස්වරම් හා අලාරිප්පු ය. (4) ජතිස්වරම් හා වර්ණම් ය.
(5) පදම් හා තිල්ලානා ය. (………)

**20.** සාම්ප්‍රදායික බලි රූපයක් වර්ණ ගැන්වීම සඳහා යොදාගනු ලබන්නේ,
(1) ගස්වල පොතු, කිරි මැටි සහ තේ කොළ ය.
(2) ගස්වල පොතු, බුලත් විට සහ දැලි ය.
(3) ශාක පත්‍ර යුෂ, ගඩොල් කුඩු සහ පැන්කේක් ය.
(4) ශාක පත්‍ර යුෂ, දැලි සහ පවුඩර් ය.
(5) ශාක පත්‍ර යුෂ, දැලි සහ අඹරාගත් කහ ය. (………)

**21.** කථක් නර්තනය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1) පඛාවජ්, මද්දල සහ හාර්මෝනියම් වේ.
(2) පඛාවජ්, තබ්ලාව සහ හාර්මෝනියම් වේ.
(3) චෙන්ඩාව, මෘදංගම් සහ කෝල් බෙරය වේ.
(4) චෙන්ඩාව, පඛාවජ් සහ වීණාව වේ.
(5) චෙන්ඩාව, තබ්ලාව සහ වයලීනය වේ. (………)

**22.** නර්තන කලාවේ ආහාර්ය අභිනය ලෙස සැලකෙන්නේ,
(1) වේදිකා සැරසිලි, ආලෝකය සහ රංගවස්ත්‍රාභරණ ය.
(2) වේදිකා සැරසිලි, සංගීතය සහ වාදන උපකරණ ය.
(3) වේදිකා සැරසිලි, ආලෝකය සහ නළු නිළියන් ය.
(4) වේදිකා සැරසිලි, රංග වින්‍යාසය සහ රංගවස්ත්‍රාභරණ ය.
(5) රංග වස්ත්‍රාභරණ, ආලෝකය සහ රංග වින්‍යාසය ය. (………)

**23.** රංග වින්‍යාසයේ මූලික සංකල්පයක් වන චලනයෙහි ස්වභාවය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වන්නේ,
(1) කාලය, වේගය, දුර සහ අවකාශය වේ.
(2) තාලය, අංග, ප්‍රත්‍යාංග සහ උපාංග වේ.
(3) ශක්තිය, කාලය, හැඩතල සහ ප්‍රත්‍යාංග වේ.
(4) ශක්තිය, කාලය, වේගය සහ දුර වේ.
(5) ශක්තිය, කාලය, වේගය සහ හැඩතල වේ. (………)



Department of Examinations Sri Lanka


**24.** මන්තිරි වන්නම, හංස වන්නම සහ නළඟන වන්නම යන නවතම වන්නම් නිර්මාණය කර ඇත්තේ පිළිවෙළින්,
(1) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ආරියරත්න කළුආරච්චි ය.
(2) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ජයසේන කෝට්ටගොඩ ය.
(3) ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ ප්‍රේමකුමාර එපිටවෙල ය.
(4) ආරියරත්න කළුආරච්චි, ප්‍රේමකුමාර එපිටවෙල සහ මුදියන්සේ දිසානායක ය.
(5) මුදියන්සේ දිසානායක, ඇස්. පණිභාරත සහ ආරියරත්න කළුආරච්චි ය. (.........)

**25.**


A



B



C



ඉහත A, B සහ C රූපවලින් දක්වා ඇත්තේ පිළිවෙළින්,
(1) පහන් පැළ, ගොප් ගෙඩිය සහ සුනියම් වීදිය වේ.
(2) පහන් පැළ, ගොප් ගෙඩිය සහ කිරිමැස්ස වේ.
(3) පහන් පැළ, ගොප් ගෙඩිය සහ යහන වේ.
(4) ගොටුව, ගොප් ගෙඩිය සහ තොරණ වේ.
(5) ගොටුව, ගොප් ගෙඩිය සහ යහන වේ. (.........)

● අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

**26.** සංඛපාල රජු හා සම්බන්ධ කතා පුවත අයත් වන්නේ.......................................... ශාන්තිකර්මයට ය.

**27.** නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වෙන පරිදි රස නිෂ්පත්තිය සඳහා විභාව, අනුභාව සහ ......................................... භාව සංයෝග වන බව කියැවේ.

**28.** රුසියාවේ ..................................... රඟහල, බැලේ රංග කලාව සඳහා වඩාත් ප්‍රසිද්ධියට පත් වූවකි.

**29.** සලුපාළිය සහ ගිරිදේවි යන නර්තන අංග නූතන වේදිකාවට හඳුන්වා දෙන ලද්දේ ............................ නම් පහතරට නර්තන ශිල්පියා විසිනි.

**30.** හඬ සුසර කර ගැනීම සඳහා **සවරම** යොදා ගනු ලබන්නේ ............................. නම් වාද්‍ය භාණ්ඩයට ය.

**31.** තිශ්‍ර ජාති සහ මිශ්‍ර ජාති යන තාල ලක්ෂණ .................................... තාල පද්ධතියට අයත් වේ.

**32.** තල තුනක්, කෝණ හතරක් සහ දිසා ........................... ක් නර්තන අවකාශ භාවිතයේ දී නියෝජනය වේ.

**33.** චුක්කිනියා සහ ඩුංගුරුවා යන චරිත දක්නට ලැබෙන්නේ ............................. ජන නාටකයේ දී ය.

**34.** මහනුවර යුගයේ දී වන්නම් සහ ප්‍රශස්ති ගායනා වශයෙන් ඉදිරිපත් වූයේ දළදා මාළිගා භූමියේ පිහිටි ....................................................... දී ය.

**35.** කලුතාරම් සහ කුප්පායම් යන ආභරණ පළඳිනු ලබන්නේ භාරතීය ................................ නර්තනය සඳහා ය.



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර **තිත් ඉර** මත ලියන්න.

**36.** 'කලු යකා' සහ 'දරු නැලවිල්ල' යන නාට්‍යමය පෙළපාළි අයත් වන ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(i) කලු යකා: ..............................................................

(ii) දරු නැලවිල්ල :..............................................................

**37.** 'මඩුපුරය' සහ 'හත් අඩිය' ඇතුළත් ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(i) මඩුපුරය : ..............................................................

(ii) හත් අඩිය :..............................................................

**38.** 'හංගි අවච්බා' සහ 'ශ්ලෝකම්' යන නර්තන අංග අයත් වන නර්තන සම්ප්‍රදායන් දෙක ලියන්න.

(i) හංගි අවච්බා: ..............................................................

(ii) ශ්ලෝකම් :..............................................................

**39.** **හංස විල** යන බැලේ නිර්මාණයෙහි නර්තන රචකයා සහ සංගීත නිර්මාණ ශිල්පියා නම් කරන්න.

(i) නර්තන රචකයා: ..............................................................

(ii) සංගීත නිර්මාණ ශිල්පියා :..............................................................

**40.** පහත නම් සඳහන් ප්‍රවීණ නර්තන ශිල්පිනිය හා ශිල්පියා ප්‍රසිද්ධියට පත් වූයේ කවර නර්තන සම්ප්‍රදායන් සඳහා ද?

(i) බාල සරස්වති: ..............................................................

(ii) බිර්ජු රාජ් :..............................................................

**41.** පහත **A** හා **B** රූපවලින් දැක්වෙන සන්නියකුම ශාන්තිකර්මයේ නිරූපිත චරිත නම් කරන්න.

A



B



(i) **A** රූපය: ..............................................................

(ii) **B** රූපය :..............................................................

**42.** "බුද්ධං සරණං සිරස දරා ගෙන ...." යන කවි පදය මාත්‍රා තුනේ තාල රූපය අනුව ගැයීමේ දී ඊට අයත් සඳැස් මත් සහ ගී මත් ගණන සඳහන් කරන්න.

(i) සඳැස් මත් : ..............................................................

(ii) ගී මත් :..............................................................



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**43.** 'භරත' සහ 'කථකලි' නර්තන සම්ප්‍රදායන්හි ගුරුවරුන් හඳුන්වන විශේෂිත නාම දෙක ලියන්න.

(i) භරත : ..............................................................................

(ii) කථකලි :.............................................................................

**44.** 'සිංහල ගැමි නාටකය' සහ 'සිංහල සැරසිලි කලාව' යන කෘති රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(i) සිංහල ගැමි නාටකය: ...........................................................

(ii) සිංහල සැරසිලි කලාව :.......................................................


**45.** විල්සන් ඔලබොඩුව සහ රද්දැල්ලේ පොඩි මහත්තයා යන නර්තන ශිල්පීන් ප්‍රවීණත්වයක් දැක්වූයේ කුමන නර්තන සම්ප්‍රදායන් සඳහා ද?

(i) විල්සන් ඔලබොඩුව: ..............................................................


(ii) රද්දැල්ලේ පොඩි මහත්තයා :.................................................

● අංක **46** සිට **47** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.

**A**



**B**



**C**



**D**



**46.** ඉහත **A** සහ **B** රූපවලින් දක්වා ඇති රංග වස්ත්‍රාභරණ නම් කරන්න.

(i) **A** රූපය :..........................................................................

(ii) **B** රූපය :.........................................................................

**47.** ඉහත **C** සහ **D** රූපවලින් නිරූපිත නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) **C** රූපය :..........................................................................

(ii) **D** රූපය :.........................................................................

**48.** "කන්ද මුදුන්නේ පොකුණක මවාලා
එ දිය කෙළින්නට බිසවක් මවාලා"

මෙම කවිය අයත් වන ශාන්තිකර්මය සහ පෙළපාලි අංගය ලියන්න.

(i) ශාන්තිකර්මය: .........................................................................

(ii) පෙළපාලි අංගය :.....................................................................

**49.** ලක්දිව, බලියාගය බෞද්ධ මුහුණුවරකින් ස්ථාපිත කරලීමට පුරෝගාමී වූ හිමිවරුන් **දෙදෙනකු** සඳහන් කරන්න.

(i) ...........................................................................................

(ii) ...........................................................................................

**50.** සෞන්දර්ය අධ්‍යයන ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය සහ එය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය සඳහන් කරන්න.

(i) කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය: ...............................

(ii) ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය :.........................

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

AL/2019/52-S-II(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2019**

| | | |
|---|---|---|
| **නර්තනය - (දේශීය) II**<br>நடனம் - (தேசிய) II<br>Dancing - (Indigenous) II | **52 S II** | **2019.08.08 / 0830 - 1140** |

| | |
|---|---|
| ***පැය තුනයි***<br>*மூன்று மணித்தியாலம்*<br>*Three hours* | **අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **I** වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II, III, IV** කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද **(ii)** කොටසට ලකුණු **06** ක් ද **(iii)** කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(අ) රුඳ ගත ගත ගත කුකුඳත් ගජිංත ගත් ජිත් කුංදත්

(ආ) රෙගත් තම් ගත ගත්තම් ගුද ගත්තම් ගත ගත් දොම්

(ඇ) ජිංත කුකුඳ ගතිත කුකුඳ ජිංත කුකුඳ තා තකට

(ii) පහත සඳහන් කවි පද මාත්‍රා හතරේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"සිරිවස ගෙන අසු නැගෙමින් නොලෙසා
සිරිබර ඉඹුලේ තුරු රැස නිවෙසා"

(iii) උඩරට කිරළා වන්නමේ අඩව්ව හෝ පහතරට නළු ගීතිකා තාලයේ ඉරට්ටිය හෝ මණ්ඩුක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** සිංහල ශාන්තිකර්ම පද්ධතිය වූ කලි සමාජ සාරධර්ම හා ආකල්ප මත බැඳී පවතින්නකි.

(i) දෙවොල් මඩුව හෝ පහන් මඩුව ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතා මගින් හෙළිවන සමාජ සාරධර්ම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) අයහපත් ක්‍රියාකලාපවල ඵල විපාක සමාජයට බලපාන ආකාරය සන්නියකුම ඇසුරෙන් සනාථ කරන්න.

(iii) තත් කාලීන සමාජ සම්බන්ධතා ගොඩනැගී ඇති ආකාරය කොහොඹා යක් කංකාරියේ චාරිත්‍ර විධි ඇසුරෙන් ඇගයීමට ලක්කරන්න.

**3.** රංග වස්ත්‍රාභරණ, සැරසිලි හා අලංකරණවලට සෑම ශාන්තිකර්මයක දී ම විශේෂත්වයක් හිමි වේ.

(i) වෙස් ඇඳුම් කට්ටලය හෝ තෙල්මේ ඇඳුම් කට්ටලය හෝ සබරගමු ප්‍රධාන ඇඳුම් කට්ටලය අතුරෙන් එකක් තෝරාගෙන එහි කොටස්වල පවතින විශේෂතා විග්‍රහ කරන්න.

(ii) සන්නියකුමේ ආහාර්ය අභිනයෙහි විශේෂතා සන්නි **දෙකක්** ඇසුරෙන් විචාරයට ලක්කරන්න.

(iii) "බලි ශාන්තිකර්මයේ සැරලිසි ක්‍රම අනෙක් ශාන්තිකර්මවලට වඩා වෙනස් මුහුණුවරක් ගනී." විමසන්න.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

## II කොටස

**4.** දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී ඓතිහාසික තොරතුරු මෙන් ම විවිධ වූ සංස්කෘතික ලක්ෂණ ද බල පෑ බව මූලාශ්‍රය මගින් හෙළි වේ.

(i) පොළොන්නරු යුගයේ නර්තන කලාව සඳහා භාරතීය ආභාසය ලැබූ බවට සාධක **දෙකක්** ඉදිරිපත් කොට ඊට බලපෑ කරුණු විස්තර කරන්න.

(ii) කෝට්ටේ යුගයේ නර්තන කලාව ව්‍යාප්තව පැවති බවට සංදේශ කාව්‍ය **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) 1970 දශකයේ දී නර්තන කලාවේ සිදු වූ ප්‍රවණතා **හතරක්** තෝරාගෙන විෂයය ප්‍රවර්ධනය සඳහා ඒවායෙහි බලපෑම සාකච්ඡා කරන්න.

**5.** (i) "සොකරි, කෝලම් නාටකවල එකිනෙකට වෙනස් වූ අනන්‍යතා ලක්ෂණ ගොඩනැගී තිබේ." චරිත **දෙකක්** ඇසුරෙන් නාටක දෙකෙහි වෙනස්කම් පැහැදිලි කරන්න.

(ii) "ගැමි නැටුම් හා එම ගායනා මගින් හෙළිවන්නේ ඔවුන්ගේ අව්‍යාජත්වයයි." ගැමි නැටුම් **දෙකක්** නිදසුන් ලෙස ගෙන ඉහත පාඨය සනාථ කරන්න.

(iii) ප්‍රධාන වාද්‍ය භාණ්ඩ **දෙකක්** තෝරා ගෙන ඒවා සන්නිවේදන කාර්යයට යොදා ගන්නා ආකාරය හා එහි විශේෂතා ඇගයීමට ලක්කරන්න.

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) | (ආ) | (ඉ) |
|---|---|---|
| වර්ණම් | නාහර් සිං කුමාර් | ඇස්. පණිභාරත |
| රාස්ලීලා | මහා පීටර් | ඒ. ඉඹුල්ගොඩ |
| පරන් | උදය ශංකර් | චිත්‍රසේන ඩයස් |
| තෝඩායම් | ජිනදාස වික්‍රමසිංහ | ප්‍රේමකුමාර එපිටවෙල |

(i) **(අ)** කොටසෙහි සඳහන් **කථක්** නර්තනාංගය පිළිබඳ විස්තර කරන්න.

(ii) **(ආ)** කොටසෙහි සඳහන් **භාරතීය නෘත්‍ය නාටක ශිල්පියා** නම් කර ඔහුගේ නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) **(ඉ)** කොටසේ සඳහන් නම් අතරෙන් සැලළිහිණිය මුද්‍රා නාට්‍යයේ නිර්මාණ ශිල්පියා තෝරාගෙන ඔහුගෙන් දේශීය මුද්‍රා නාට්‍ය කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක්කරන්න.

**7.** (i) "නල දමයන්ති මුද්‍රා නාට්‍යය සඳහා දේශීය හා විදේශීය මුද්‍රා නාට්‍යවල ආභාසය ලැබී ඇත." විමසන්න.

(ii) බටහිර බැලේ සංකල්පයේ ප්‍රභවය හා විකාශනය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) රසභාව සංකල්පය නාන්‍දුමුරය හෝ සන්නි ඇසුරෙන් විමසුමට ලක්කරන්න.

## IV කොටස

**8.** අද්‍යතන ප්‍රාසංගික නර්තන නිර්මාණයේ දී ආනුෂංගික කලා භාවිතය වැඩි වශයෙන් දැකිය හැකි ය.

(i) රංගාලෝකය සඳහා භාවිත කෙරෙන විදුලි පහන් වර්ග **තුනක්** විස්තර කරන්න.

(ii) නූතන රංගවස්ත්‍රාභරණවල විවිධතා හා ප්‍රවණතා සාකච්ඡා කරන්න.

(iii) රංග භූමි අලංකරණයේ දී භාවිත ශිල්ප ක්‍රම ඇගයීමට ලක්කරන්න.

**9.** අද්‍යතන රුචිකත්වය මත නූතන සමාජ නර්තන කලාවක් බිහි වී තිබේ.

(i) ගීත නර්තන කලාවේ ජනප්‍රියත්වය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(ii) "රියැලිටි (Reality) නර්තන තරගවලින් පාසල් දරුවන්ට අත්වැලක් ලබාදේ ද?" විමසන්න.

(iii) අද්‍යතනයේ නර්තනය හා සංගීතය යොදා ගන්නා සමාජ අවස්ථා දෙකක් තෝරාගෙන ඊට ප්‍රේක්ෂක රුචිකත්වය බලපා ඇති ආකාරය විචාරය කරන්න.

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka